සියලු ම හිමිකම් ඇවිරිණි/All Right Reserved / முழுப் பதிப்புரிமையுடையது

# ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය
# இலங்கை அபிவிருத்தி நிருவாக நிறுவகம்
# SRI LANKA INSTITUTE OF DEVELOPMENT ADMINISTRATION

**ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ නිලධාරීන් සඳහා වන පළමුවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2020(I)**

කාලය: පැය 03

**නීතිය හා කළමනාකරණය - 07**

විභාග අංකය
Index No / சுட்டெண்
.......................................

- **එක් කොටසකින් අවම වශයෙන් ප්‍රශ්න දෙකක් (02) තෝරාගෙන ප්‍රශ්න 05කට පිළිතුරු සැපයිය යුතුය.**
- **සෑම ප්‍රශ්නයකටම ලකුණු 20 බැගින් හිමිවේ.**

---

## I කොටස

01. I. ශ්‍රී ලංකාවේ අධිකරණ පද්ධතිය තුළ ඇති අධිකරණ වර්ග නම් කරන්න. (Court Hierarchy) (ලකුණු 10)

II. ඔබ විසින් ඉහත සඳහන් කළ අධිකරණ අතුරින් අධිකරණ දෙකක් (02) පිළිබඳව කෙටි සටහන් ලියන්න. (ලකුණු 10)

02. I. භාණ්ඩ විකිණීම සම්බන්ධව ලංකාවේ බලපවත්වන නීතිය කුමක්ද? (ලකුණු 05)

II. භාණ්ඩ විකිණීමේ ගිවිසුමක් යනු කුමක්ද? (ලකුණු 05)

iii. භාණ්ඩ විකිණීමේ ගිවිසුමක සිටිය හැකි ප්‍රධාන පාර්ශවකරුවන් නම් කර, කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

iv. A සමාගම රු. 100,000/= මිලට යන්ත්‍රයක් නිෂ්පාදනය කර B වෙත ලබාදීම සඳහා 2024.01.31 දින ගිවිසුමකට එකඟ වේ. B විසින් A නිෂ්පාදනය කරන ලද යන්ත්‍රය 2024.03.01 දින රු. 100,000/= මිල රිසිට් පත්‍රයක් ලබාගෙන රැගෙන යන ලදි.
ඉහත නිදසුන අනුව පහත සඳහන් දෑ පැහැදිලි කරන්න.

1. භාණ්ඩ විකිණීමේ ගිවිසුම
2. භාණ්ඩ විකිණීමට එකඟවීමේ ගිවිසුම (ලකුණු 05)

03. I. රක්ෂණයේ ගිවිසුමකට පාදක වන ප්‍රධාන මූලධර්ම පහක් (05) නම් කරන්න. (ලකුණු 10)

II. A සිය නිවසට රු. 500,000/= වටිනා ගිනි රක්ෂණයක් B සමාගමෙන් ලබාගෙන තිබිණි. Aගේ නිවස හදිසියේ ගිනි ගත් අතර නගර සභා ගිනි භටයින් විසින් ගින්න කඩිනමින් නිවා දමන ලදි. ගින්න නිසා නිවසට සිදුවූ හානිය රු. 100,000/= වූ අතර, රක්ෂණ සමාගම එම හානිය ගෙවීමට එකඟ විය. A මේ සඳහා එකඟ නොවූ අතර ඔහුගේ අදහස වූයේ රක්ෂණය රු. 500,000/= වූ නිසා මුළු මුදලම ගෙවිය යුතු බවය.

(අ) රක්ෂණයේ අදාළ මූලධර්මයන් අනුව ඉහත තත්ත්වය පැහැදිලි කරන්න. (ලකුණු 05)

(ආ) A සිය නිවස, B හා C සමාගම් දෙකෙහිම රු. 500,000/= මුදලට රක්ෂණය කර තිබේ නම්, A ට B හා C සමාගම් දෙකෙන්ම රු. 100,000/= බැගින් සිදුවූ හානියට වන්දි ඉල්ලා සිටිය හැකි දැයි කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

## II කොටස

04. I ඒබ්‍රහම් මැස්ලෝගේ අවශ්‍යතා ධූරාවලිය අනුව මිනිසුන්ගේ අවශ්‍යතා ස්ථර පහක් (05) මූලිකවම හඳුනා ගනී. මෙම අවශ්‍යතා ස්ථර පහ (05) නම් කරන්න. (ලකුණු 05 )

II ඉහත (I) හි දක්වන ලද එක් අවශ්‍යතා ස්ථරයක් විස්තර කර ඔබ සේවය කරන ආයතනයේ සේවක අභිප්‍රේරණය සඳහා එම අවශ්‍යතා ස්ථරය සම්පූර්ණ කර සේවක අභිප්‍රේරණය ඉහළ නැංවීමට කටයුතු කළ හැකි ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 15)

05. "සංවිධාන සහ පුද්ගල කළමනාකරණයේදී වෙනස්වීම් කළමනාකරණය (Change Management) තීරණාත්මක වේ. වෙනස්වීම් කළමනාකරණයේ දී පුද්ගල බාධාවන් සහ ආයතනික බාධාවන් (Resistance) හඳුනාගැනීම ඉතා වැදගත් වේ." සාකච්ඡා කරන්න. (ලකුණු 20)

06. I. සන්නිවේදන ක්‍රියාවලිය (Communication Process) රූප සටහනකින් පැහැදිලි කරන්න. (ලකුණු 10)

II. ඉහත ක්‍රියාවලියේ පියවර දෙකක් (02) පිළිබඳව කෙටි සටහන් ලියන්න. (ලකුණු 10)

***********